*සැ. යු.* — 2014.08.22 දින පළ වූ අංක 1,877 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,878 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1058 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 1066 | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1067 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 892 |


*සැ. යු.*- ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 19 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## කොත්මලේ ප්‍රාදේශීය සභාව

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් පරිමාණය මාසික රා.ප.ච. 06/2006 - IV අනුව | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | රියදුරු (ට්‍රැක්ටර්) II (ආ) පන්තිය | 01 | PL-3-2006A<br>රු. 12,470 -10 x 130 - 10 x 145 -10 x 160- 12 x 170 = රු. 18,860 | අ. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br>ආ. තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් සහ ඉඩම් වාහන රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.<br>ඇ. රියදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසු රියදුරකු වශයෙන් වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුයි. (සහතික මගින් සනාථ කළ යුතුයි.)<br>ඈ. දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්වයක් තිබිය යුතු අතර මනා දෑස් පෙනීමක් තිබිය යුතුය.<br>ඉ. මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br>ඊ. අවම උස අඩි 5 යි අඟල් 2ක් විය යුතුය. |
| 02 | විදුලි කාර්මික III පන්තිය | 01 | PL -2-2006A<br>රු. 12,210 - 10 x 130 - 10 x 145-10 x 160 - 12 x 170 = රු. 18,600 | අ. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br>ආ. අදාළ තනතුරේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි.)<br>ඇ. වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ3) සහතිකය ලබා තිබීම ;<br>හෝ<br>ඈ. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>ඉ. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>ඊ. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ |

| අනු. අංකය | තනතුර නාමය | තනතුරු ගණන | වැටුප් පරිමාණය මාසික රා.ප.චි. 06/2006 - IV අනුව | | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | උ. | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ |
| | | | | ඌ. | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. |
| | | | | එ. | අදාළ ක්ෂේත්‍ර විදුලි කාර්මිකයෙකු වශයෙන් වසර 02ක පළපුරුද්දක් තිබීම. |
| 03 | කාර්යාල කාර්ය සහයක III පන්තිය | 06 | PL -1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130-10 x 145 - 12 x 160 = රු. 17,600 | අ. | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |
| | | | | ආ. | අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද සැලකිල්ලට ගනු ලැබේ. |
| 04 | මුරකරු III පන්තිය | 02 | PL -1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130-10 x 145 - 12 x 160 = රු. 17,600 | අ. | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |
| | | | | ආ. | අවම උස අඩි 5 අඟල් 4ක් විය යුතුය. |
| | | | | ඇ. | අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද සැලකිල්ලට ගනු ලැබේ. |
| | | | | ඈ. | දිවා සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදිය යුතුය. |
| | | | | උ. | යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කවර ස්ථානයක වුවද සේවය කිරීමට සුදුසු සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. |
| 05 | මාර්ග කම්කරු | 02 | PL -1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130-10 x 145 - 12 x 160 = රු. 17,600 | අ. | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව සිටිය යුතුය. |
| | | | | ආ. | දැනට සේවයේ නියුක්තව සිටින ආදේශක/අනියම් කම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ. |
| 06 | පුස්තකාල සේවක | 01 | PL -1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130-10 x 145 - 12 x 160 = රු. 17,600 | අ. | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම |

| අනු. අංකය | තනතුර | තනතුරු ගණන | වැටුප් පරිමාණය මාසික රා.ප.ච. 06/2006 - IV අනුව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br>ආ. පුස්තකාල සම්බන්ධයෙන් ලබා ඇති ඩිප්ලෝමා සහතිකය හා වසර දෙකකට නොඅඩු පළපුරුද්ද සැලකිල්ලට ගනු ලැබේ. |
| 07 | සෞඛ්‍ය කම්කරු | 06 | PL -1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130-10 x 145 - 12 x 160 = රු. 17,600 | අ. අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව සිටිය යුතුය.<br>ආ. දැනට සේවයේ නියුක්තව සිටින ආදේශක/අනියම් කම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ. |

01. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

- අ. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
- ආ. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන පදිංචි සහතිකයකින් සනාථ විය යුතු ය.)
- ඇ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
- ඈ. අයදුම්කරු මනා චරිතයකින් හා යහපත් ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
- ඉ. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
- ඊ. කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ස්ථිර, අනියම්, ආදේශක, තාවකාලික සේවයේ නියුක්තව සිටින සේවකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

- අ. රියදුරු, විදුලි කාර්මික තනතුර සඳහා බඳවා ගැනීමේදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්‍ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.
- ආ. අනෙකුත් තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

- අ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු දායක මුදල් ගෙවිය යුතු ය.
- ආ. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
- ඉ. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොන්දේසි හා මුදල් රෙගුලාසිවලට ද පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලට ද කොත්මලේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.
- ඊ. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.
- උ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර තුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුවේ.

04. *සේවා කොන්දේසි :*

*අ. සාමාන්‍ය කොන්දේසි .-* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II වැනි පරිච්ඡේදයේ 10 වැනි හා 12 වැනි උප වගන්තිවල සඳහන් විධිවිධානවලට අදාළ වේ.

*ආ. භාෂා ප්‍රවීණතාවය .-* සෑම නිලධාරියෙකුටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන හා රජයේ භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා කලින් කළ පනවනු ලබන නීති හා රෙගුලාසි ව්‍යවස්ථා ද පිළිපැදිය යුතු ය.

*ඞ05. අයදුම් කළයුතු ආකාරය .:*

- අ. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2014.09.25 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, කොත්මලේ ප්‍රාදේශීය සභාව, පූඬළුඔය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ආ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහා අයදුම්පත (තනතුරේ නම) යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉ. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව එවිය යුතු ය.

එච්. එම්. එස්. විජේරත්න,
ලේකම්,
කොත්මලේ ප්‍රාදේශීය සභාව,
පූඩළුඔය.

2014 ක් වූ අගෝස්තු මස 08 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***කොත්මලේ ප්‍රාදේශීය සභාව***
***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කොත්මලේ ප්‍රාදේශීය සභාවේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2014***

*................................................ තනතුර සඳහා අයදුම්පත*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම්:————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
03. ස්ථිර ලිපිනය:————.
04. උපන් දිනය ඃ
    වර්ෂය :————. මාසය:————. දිනය:————.
05. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ
    අවුරුදු :————. මාස :————. දින :————.
06. ජාතික හැඳුනුම්පත් අංකය:————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය:————.
08. විවාහක/අවිවාහක බව:————.
09. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද/ලියාපදිංචීමෙන් ද ?:————.
10. අධ්‍යාපන සුදුසුකම් සමත් වූ විභාග පිළිබඳ විස්තර :————.
11. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) :————.
12. සේවා පළපුරුද්ද :————.
13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?:————.
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්කරු වන .................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ..................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමකට හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා
ලෙස පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය:————.
දෙපාර්තමේන්තුව/ආයතනය:————.
දිනය:————.

08-925

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

*ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම.*

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | (රා.ප.ච. 6/2006 iv) PL1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 -17,600 | අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර) |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය ;
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු යි; (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථකර තිබිය යුතුයි.);
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුයි. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාල නොවේ.);
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතු යි;
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුයි.

*03. බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ;
2. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ;
3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ;
4. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. සියලුම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි;
3. බඳවා ගනු ලබන තැනැත්තන් වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ;
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුයි;
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

*05. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.09.24 වැනි දින හෝ ඊට ප්‍රථම "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.
2. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.
3. අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.

   (i) උප්පැන්න සහතිකය;
   (ii) අධ්‍යාපන සහතිකය ;
   (iii) තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;

(iv) මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුයි.);
(v) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික. (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය;

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ අගෝස්තු මස 11 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය.*

01. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :————.

02. ස්ථිර ලිපිනය:————.
03. (i) උපන් දිනයඃ
අවුරුද්ද :————. මාසය:————. දිනය:————.
(ii) 2014.09.24 වැනි දිනට වයස ඃ
අවුරුදු:————. මාස:————. දින:————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය:————.
06. විවාහක/අවිවාහක බව:————.
07. ජාතිය:————.
08. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය:————.
09 .ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:————.
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):————.
(i) සමත් වූ වසර /ශ්‍රේණිය වර්ෂය:————.
(ii) අ.පො.ස. (සා. පෙළ) විභාගය:————.
විභාග අංකය:————. වර්ෂය:————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(iii) අ.පො.ස. (උ. පෙළ) විභාගය:————.
විභාග අංකය:————. වර්ෂය:————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර:————.
13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?:————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව හා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය:————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත් දැනට.................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

දිනය:————.

08-998

## පුත්තලම නගර සභාව

පුත්තලම නගර සභාවේ පුරප්පාඩු වී ඇති වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ III ශ්‍රේණියට අදාළ පහත සඳහන් තනතුරු සඳහා බඳවාගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය පරිපාලක | 02 | PL1 2006A | රු 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160 - රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 02 | මුරකරු | 02 | PL1 2006A | රු 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160 - රු. 17,600 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ විෂයයන් 02 ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 03 | සෞඛ්‍ය කම්කරු | 06 | PL1 2006A | රු 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160 - රු. 17,600 | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 වන ශ්‍රේණිය සමත් විය යුතුය. |
| 04 | බර වාහන කම්කරු | 01 | PL3 2006 A | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් වත් සමත් වී තිබීම. අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 5 ක් සමත් විය යුතුය.<br><br>තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබීම. |

*පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
(ii) අයදුම්කරු පුත්තලම නගර සභා බලප්‍රදේශය තුළ අනුගාමී වසර 03 ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
(iii) පුත්තලම නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.
(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.
(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
(vii) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණකින් සුදුස්සන් තෝරාගනු ලබයි.
(viii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පුත්තලම නගර සභාවේ ලේකම් සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය:-*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු හා අරමුදලට දායකත්වය හිමිවේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(iv) මෙම බඳවාගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය ඃ-*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2014.09.30 වැනි දිනය හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, නගර සභාව, පුත්තලම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර "........................................................ " යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පුත්තලම නගර සභාවේ ලේකම් සතුය.

තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

අයදුම්පත සමඟ පහත සහතික වල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය),
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,
(v) පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික,
(vi) පුත්තලම නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

ඩබ්. ජී. නිශාන්ත කුමාර,
ලේකම්,
පුත්තලම නගර සභාව.

2013 අගෝස්තු මස 13 වැනි දින,
පුත්තලම නගර සභාව,
පුත්තලම.

ආදර්ශ අයදුම්පත්‍රය

**පුත්තලම නගර සභාවේ ................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:————.
03. තැපැල් ලිපිනය:————.
04. දුරකථන අංකය:————.
05. උපන් දිනය ඃ වර්ෂය:————. මාසය:————. දිනය:————.
06. ජාතික හැඳුනුම්පත් අංකය:————.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:————. මාස :————. දින:————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය:————.
09. විවාහක/අවිවාහක බව:————.
10. ජාතිය:————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද, එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද යන වග:————.
12. අධ්‍යාපන සුදුසුකම්:————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:————.
14. ඔබ දැනටමත් පුත්තලම නගර සභාවේ සේවය කරන්නේ නම්,
    (i) දැනට දරන තනතුර:————.
    (ii) එම තනතුරට පත් වූ දිනය:————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මතද:————.
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර :————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි. එම සියලුම කොන්දේසි වලට මා යටත් වන බවද මෙයින් දන්වා සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන.............................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ... .......................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරය හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :———.
තනතුර :———.
නිලමුද්‍රාව :———.

08-978

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## හැටන් දික්ඔය නගර සභාව

### හැටන් පොදු වෙළඳපොළ පිහිටි අංක 20 හා 21 දරන කඩකාමර බදු දීම

මෙම සභාවට අයත් හැටන් පොදු වෙළඳපොළ පිහිටි පහත සඳහන් අංක 20 හා 21 දරන කඩකාමර බදු පදනම මත ලබාදීමට සභාව විසින් තීරණය කර ඇත. ඒ සඳහා මුද්‍රා කරන ලද ටෙන්ඩර් අයදුම්පත් 2014.09.25 දින පෙ.ව. 9.30 දක්වා මා විසින් භාරගනු ලැබේ.

| *කඩ කාමර අංකය* | *නැවත ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල රු. ශත* | *ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තු + (VAT+NBT) රු. ශත* | *අවම ලංසුව (12%VAT+2%NBTසමග) රු. ශත* |
|---|---|---|---|
| අංක 20 කඩකාමරය | 100,000.00 | 5,000.00 | 912,000.00 |
| අංක 21 කඩකාමරය | 100,000.00 | 5,000.00 | 912,000.00 |

1. ටෙන්ඩර් අයදුම්පත් - 2014.09.24 දින ප.ව. 2.30ට පෙර අයදුම්පත් ගාස්තු හා නැවත ලබාදෙන තැන්පත් මුදල් ගෙවා කාර්යාලයෙන් ලබාගත හැකිය.
2. කඩ කාමරය පරීක්‍ෂා කිරීම - සතියේ වැඩ කරන වේලාවන් තුළදී පරීක්‍ෂාකර බැලීමට හැකිය.
3. මාසික කුලිය - රජයේ තක්සේරුකරු විසින් කරනු ලබන තක්සේරුව අනුව මාසික කුලී මුදල් ගෙවිය යුතුය.
4. බදු කාලය - වසර 03කි.
5. ටෙන්ඩර් විවෘත කිරීම - 2014.09.25 දින පෙ.ව. 10.00ට නගර සභා රුස්වීම් ශාලාවේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.
6. සියලුම ටෙන්ඩර් අයදුම්පත් මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර ලියුම් කවරයේ ඉහළ කෙළවර වම්පස "හැටන් පොදු වෙළඳ පොළ අංක ................................. දරන කඩ කාමරය බදු දීම" යනුවෙන් සඳහන් කර සභාපති, හැටන් දික්ඔය නගර සභාව හැටන් යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ නගර සභාවේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.
7. ටෙන්ඩර් කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.
8. පිළිගත් ටෙන්ඩර්කරු විසින් මුළු මුදලම ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී එකවර ගෙවිය යුතුය.

වැඩි විස්තර හැටන් දික්ඔය නගර සභාවේ සභාපති/ලේකම්ගෙන් ලබාගත හැකිය.
051-2222275/051-2222276.

වෛද්‍ය අලගමුත්තු නන්දකුමාර්,
සභාපති,
හැටන් දික්ඔය නගර සභාව.

2014 අගෝස්තු මස 07 වැනි දින,
හැටන් දික්ඔය නගර සභා කාර්යාලයේ දී ය.

08-885

# පළාත් පාලන නිවේදන

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

**වීථි නම් කිරීම**

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ නම් සඳහන් මාර්ග වීථි උපලේඛනයේ "යෝජිත නාමය" යටතේ නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරන ලදුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව මාර්ගය මින් ඉදිරියට යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බව මින් නිවේදනය කරමි.

සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| | *මාර්ගය* | *යෝජිත මාර්ගය* |
|---|---|---|
| 01. | බටපොල මංසන්ධිය අසල පිහිටි ගාල්ල, ඇල්පිටිය මාර්ගයෙන් ආරම්භ වන ජනසළු ආයතනය අසල මාර්ගය | ගම් සභා නියෝජිත ජිනසේන වරුෂවිතාන මාවත |

08-1081

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.